බලංගොඩ ප්‍රාදේශීය සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

-------------------------------

01. මූල්‍ය ප්‍රකාශන

1.1. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්ථාව 2017 අගෝස්තු 17 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට බලංගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් සභාව සතු ඉඩම් 12 කට අදාල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සභාවට නව ජල සම්බන්ධතාවයක් ලබා ගැනීම වෙනුවෙන් වැය කර තිබුණු රු. 25,841 ක් පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රු. 37,195 ක් වූ කර්මාන්ත ගබඩා ආරම්භක තොගය සහ රු. 148,290 ක් වූ කර්මාන්ත ගබඩා අවසන් තොගය අදාල වැය ගිණුම්වලට ගැලපුම් නොකර සමුච්චිත අරමුදල් සහ ඌණතා ගිණුමට ගැලපීම් කර තිබුණි.

1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන අක්කර බදු රු. 29,043 ක් 2017 ජූනි වනවිටත් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වර්ෂ 08 කට වඩා වැඩි කාලයක සිට පැවත එන වෙළෙඳ බලපත්‍ර ගාස්තු රු. 97,500 ක් 2017 ජූනි වනවිටත් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව ලැබියයුතු හිඟහිටි වෙලිඔය කඩ කාමර බදු කුලී රු. 17,943 ක් 2017 ජූනි වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2009, 2012 සහ 2015 වර්ෂ වලට අදාළව එකතුව රු. 224,770 ක් වූ වියදම් ණයහිමි ශේෂ 05 ක් නිරවුල් කිරීමට 2017 ජූනි වනවිටත් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඉ) සභාවට අයත් පදිංචිය සඳහා බදු දී තිබුණු යහකළු මූකලාන ප්‍රදේශයේ බිම් කට්ටි 11 ක් වෙනුවෙන් අයවිය යුතු කුලී රු. 36,000 ක් අයකර ගැනීමට 2017 ජූලි වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් සභාව වෙත ලබා දුන් රු. 1,000,000 ක අත්තිකාරම් මුදලින්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් පසු ඉතිරි වු රු. 515,521 ක් 2017 ජූනි වනවිටත් පියවා නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ස්ථාවර වත්කම් විෂයයන් 04 ක් සනාථ කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය , විස්තරාත්මක උපලේඛන හා අනෙකුත් ගිණුම් විෂයයන් 02 ක් සනාථ කර ගැනීම සඳහා කාල විශ්ලේෂණ වාර්තා, සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) එකතුව රු. 95,798,171 ක් වූ ජර්නල් සටහන් 23 ක් සඳහා ජර්නල් වවුචර් ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) ලැබිය යුතු, ඉදිරියට ලද සහ අවසන් තොග වලට සම්බන්ධ ගිණුම් 18 කට අදාල එකතුව රු. 49,915, 954 ක් වූ ජර්නල් වවුචර් සහ ජර්නල් සටහන් ඉදිරිපත් නොකෙරුණි.

1.3.4. නීති ,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

-------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) | මු.රෙ 571 | 2016 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ පැවති රු. 978,855 කට අදාලව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම හිමිකම් නොපාන ලද "ඉකුත් වූ" තැන්පතු පිළිබඳව ලැයිස්තු පිළියෙල කර තැන්පතු නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| | (ii) | මු.රෙ 104(1), (3), (4) සහ 110 | අනතුරකින් රු. 655,114 ක අලාභයක් සිදුව තිබූ වාහනයක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණු අතර අනතුර හානි පිළිබඳ ලේඛනයක වාර්තා කර නොතිබුණි . |
| | (iii) | මු.රෙ 137 | සේවාවන්, වැඩ හෝ සැපයුම් සඳහා ගෙවන ලද එකතුව රු. 84,260 ක් වූ ගෙවීම් 09 ක් සභාවේ ලේකම් විසින් අනුමත කිරීමකින් තොරව ගෙවා තිබුණි. |
| | (v) | මු.රෙ 371(5) | 1992 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල නිකුත් කරන ලද එකතුව රු. 474,279 ක් වූ අතුරු අග්‍රිම 35 ක් 2017 ජූනි වනවිටත් පියවා නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | |
| | (i) | iii අධිකාරියේ 29 රීතිය | එකතු වී ඇති සම්පූර්ණ මුදල දිනපතා බැංකුවේ තැන්පත් කළ යුතු වුවත්, විගණන නියැදි පරීක්ෂාව අනුව රු. 75,000 සිට රු. 200,000 දක්වා වූ සභාවේ දෛනික ආදායම් දින 02 සිට දින 06 ක් දක්වා සැලකිය යුතු කාලයක් අත රඳවා ගෙන තිබුණි. |

(ii) vii අධිකාරියේ 165 රීතිය

එකතුව රු. 51,704,278 ක් වූ ආදායම් සහ එකතුව රු. 44,220,202 ක් වූ වියදම් සම්බන්ධයෙන් ප්‍රධාන ලෙජරයේ ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(iii) viii වැනි අධිකාරියේ 178 රීතිය

යම් වැඩක්, සැපයුමක් හෝ සේවාවක් කොන්ත්‍රාත් මත ඉටු කරනු ලබන කල්හි, සෑම වර්ෂයක් සඳහාම අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත ප්‍රසම්පාදන මණ්ඩලයක් පත්කළ යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි.

(iv) xii වැනි අධිකාරියේ 214 රීතිය

2016 දෙසැම්බර් 31 දිනට රු. 148,290 ක් වූ කර්මාන්ත ගබඩා තොගය සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් කර නොතිබුණි.

(ඇ) 1975 පළාත් පාලන විශ්‍රාම වැටුප් නියෝගයේ 36 වගන්තිය

1993 සැප්තැම්බර් 03 දිනට පෙර විශ්‍රාම ලැබූ පළාත් පාලන සේවයේ විශ්‍රාමික නිළධාරීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා සභාව විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතුව රු. 1,140,334 ක් වූ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2005 ජූනි 01 දිනැති අංක 2005/04 දරන සබරගමුව පළාත් පළාත් පාලන කොමසාරිස් ගේ චක්‍රලේඛය

(i) 03 (ii) වගන්තිය

ඉඩම් විකිණීම් වලට අදාලව කට්ටි සැලැස්ම අනුමත කිරීමට පෙරාතුව විකිණීමට යටත් බිම් කොටස්වල විකුණුම් වටිනාකම පිළිබඳ සභාවේ ආදායම් පරීක්ෂක/ පරිපාලක මගින් තාවකාලික තක්සේරුවක් ලබාගත යුතු වූවත්, 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා

කාලපරිච්ඡේදය තුළ සභා බල ප්‍රදේශයේ ඉඩම් විකිණීම මත බදු මුදල් රු.893,180 ක් ලබාගත් ඉඩම් 09 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ii) 03 (iv) වගන්තිය

2015 වර්ෂයේ සිට 2017 ජුනි 30 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළව සභා බල ප්‍රදේශයේ ඉඩම් විකිණීම මත බදු මුදල් රු.1,245,894 ක් ලබාගත් විකුණන ලද ඉඩම් 13 ක් සම්බන්ධයෙන් විකුණුම්කරු සමඟ ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i) 2.5.1(ඊ) මාර්ගෝපදේශය

දාමහන ආදාහනාගාරය සඳහා තෙකළා විදුලි ජනක යන්ත්‍රයක් රු. 995,000 කට මිලදී ගැනිමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණද, ඒ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ii) 9.3.1 මාර්ගෝපදේශය

රු. 200,000 කට වැඩි අළුත්වැඩියා කිරීම් සම්බන්ධයෙන් පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන, අනතුරකට පත් වාහනයක් රු. 655,114 ක ට අළුත්වැඩියා කර තිබුණි.

(උ) 2015 ජුලි 15 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2013 ජුනි 05 දිනැති අංක PCMO/PR/2013 දරන ජනාධිපති ලේකම්වරයාගේ ලිපිය

ගර්හිත තත්ත්වයේ පවතින යතුරු පැදියක්, කැබ් රථයක් ,රෝද හතරේ ට්‍රැක්ටර් දෙකක්, රෝද දෙකේ ට්‍රැක්ටර් තුනක්, ට්‍රැක්ටර් ටේලර් හතරක්, ට්‍රැක්ටර් කොටස් 22 ක් සහ කොන්ක්‍රීට් මිශ්‍රණ 02 ක් අපහරනය කිරීමට කටයුතු කර නොතිබුණි.

| | | |
|---|---|---|
| (ඌ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය | කාර්ය මණ්ඩලය 49 දෙදෙනෙකුගෙන් සමන්විත සභාවේ නිළධාරීන්ගේ පැමිණීම සහ පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රයක් භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 11,957,476 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 3,579,926 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,377,550 ක වර්ධනයක් ඇති වී තිබුණි.

2.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**
-----------------------------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් රු. 5,517,545 කින් වැඩි වීමත්, පෞද්ගලික පඩිනඩි සහ සැපයුම් හා උපකරණ වියදම රු. 3,910,800 කින් අඩු වීමත් ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය
---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) <u>වරිපනම්</u>

අයකර ගත නොහැකි රු. 186,988 ක් වූ හිඟහිටි වරිපනම් ගාස්තු ඇතුළුව සමාලෝචිත හා ඉකුත් වර්ෂ සඳහා හිඟව තිබූ වරිපනම් ගාස්තු රු. 213,312 ක් 2017 ජුලි වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) <u>මුද්දර ගාස්තු</u>

සමාලෝචිත වර්ෂයට අදාළව ලැබියයුතු මුද්දර ගාස්තු රු. 9,002,875 ක් හා 2015 වර්ෂයට අදාළව ලැබියයුතු මුද්දර ගාස්තු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයකර ගැනිමට 2017 ජුනි වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) <u>උසාවි දඩ මුදල්</u>

සමාලෝචිත වර්ෂයට අදාළව අයවිය යුතු රු. 856,767 ක් වූ උසාවි දඩ මුදල් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයකර ගැනීමට 2017 ජූනි වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) <u>ජලගාස්තු</u>

2009 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එනු ලැබූ රු. 14,440 ක් වූ ලැබියයුතු ජල ගාස්තු 2017 ජූනි වනවිටත් අයකර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1. කළමනාකරණ ක්‍රියාකාරකම්
--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ සභාවට ලැබී තිබූ ට්‍රැක්ටර් 03 ක් සභාව වෙත පවරාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 1994 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ කොන්ත්‍රාත්කරුවන් 69 දෙනෙකුට ගෙවිය යුතු රු. 280,711 ක් වූ කොන්ත්‍රාත් ඇප මුදල් සම්බන්ධයෙන් 2017 ජූනි වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්
---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 ජූනි 20 දින පැවති මහා සභා රැස්වීමේ තීරණය අනුව සභා කාර්යාලයේ ගරාජයට අවහිරව පැවති කපා ඉවත්කරන ලද කොස් ගස් වල කඳන් ඉරා ලී බවට පත් කිරීමට තීරණය කර තිබූ නමුත්, 2017 ජූනි 30 දින වනවිටත් එම තීරණය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව සිව් අවුරුදු සැලැස්මේ ඇතුලත් 2016 වර්ෂය තුළ සභා අරමුදලින් ඉටුකිරිම සඳහා ඇස්තමේන්තු කර තිබුණු රු. 6,160,000 ක ව්‍යාපෘති 44 කින් රු. 2,400,000 ක ව්‍යාපෘති 4 ක වැඩ ආරම්භ කර නොතිබුණු අතර ව්‍යාපෘති 04 ක ඇස්තමේන්තු පිළියෙල කිරීමට 2017 ජූනි 30 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සභාව වෙත ලබා දී තිබුණු රු. 832,571 ක් වටිනා ගැල්වනයිස් බට 752 ක් වසර 03 ක පමණ කාලයක සිට සභා භූමියේ ඉදිකෙරෙමින් පවතින ගරාජයේ අනාරක්ෂිතව ගබඩාකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට හඳුනාගත් රු. 1,000,000 ක වටිනාකමක් සහිත වේලි ඔය සති පොළ කඩකාමර හා පොළ භූමිය අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය 2017 ජූනි වනවිටත් ආරම්භ කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය
-------------------------

දාමහන ආදාහනාගාරය ඉදිකිරීම් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ආදාහනාගාරය ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගම විසින් 2016 ජනවාරි 26 දින සභාව වෙත ඉදිරිපත් කර තිබූ රු. 7,966,556 ක් වූ අවසන් බිල්පතෙහි අඩුපාඩු පවතින බැවින් එය නිර්දේශ කිරීමට නොහැකි බව වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරී 2016 අගෝස්තු මසයේදී දන්වා තිබුණද, ඒ සම්බන්ධයෙන් 2017 ජූනි වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) අවම වශයෙන් මෘතදේහ 85 ක් දැවීමෙන් පසු ආදාහනාගාරය සේවා කළ යුතු වුවත් 2015 ජූනි මස අළුත්වැඩියා කිරීමෙන් පසු එය සේවා කිරීමට කටයුතු නොකිරීමෙන් බිත්තිවලින් අධික ලෙස දුම් පිටවීම නිසා 2016 දෙසැම්බර් සිට ආදාහනාගාරය වසා දමා තිබුණි.

(iii) හදිසි ගින්නක් ඇති වුවහොත් එය නිවා දැමීම සඳහා ගිනි නිවන උපකරණ කට්ටල 02 ක් ආදාහනාගාරයේ සවි කිරීම සඳහා 2015 මැයි 15 දින ගෙන තිබූ සභා තීරණය 2017 ජූනි වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්
-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතුව රු. 5,505,318 ක් වූ වාහන හා යන්ත්‍ර උපකරණ වර්ෂ දෙකකට වැඩි කාලපරිච්ඡේදයක සිට නිෂ්කාර්යව පැවතුනි.

(ආ) වටිනාකම රු. 8,855 ක් වූ ප්ලාස්ටික් ළමා පුටු 23 ක් 2001 වර්ෂයේ සිට නිෂ්කාර්යව ගබඩාව තුල තිබුණි.

3.5. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තෘතීය සේවා මට්ටමේ රාජ්‍ය කළමනාකරණ සහකාර අධිශ්‍රේණියේ ලේකම් තනතුර පුරප්පාඩු වී තිබුණු අතර රාජ්‍ය කළමනාකරණ II ශ්‍රේණියේ නිලධාරියකු 2011 වර්ෂයේ සිට ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් පත් කර තිබුණි.

(ආ) ආදායම් පරීක්ෂක, වැඩ සුපරීක්ෂක, ආදාහනාගාර ක්‍රියාකරු, ආයුර්වේද ඖෂධ සංයෝජක, සෞඛ්‍ය කම්කරු, පුස්තකාලාධිපති, සංවර්ධන නිළධාරී, බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු, පුස්තකාල සහයක, වැඩ ක්ෂේත්‍ර කම්කරු යන තනතුරුවල පවතින පුරප්පාඩු 26 ක් පිරවීමට කටයුතු කර නොතිබීමෙන් අදාල කාර්යය සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරිමට බාධා වී තිබුණු බව නිරික්ෂණය විය.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ කසළ කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් සකස් කිරීමට කටයුතු කර නොතිබුණු අතර දිරන හා නොදිරන කසල වෙන්කිරීමකින් තොරව සභා බල ප්‍රදේශයේ ස්ථාන කිහිපයකට බැහැර කරමින් තිබුණි.

(ආ) සභාව මඟින් ගොඩකුඹුර ග්‍රාම නිලධාරි වසමේ අනිච්චියාවත්ත හේන නැමති ස්ථානයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා වනසංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අක්කරයක ඉඩමක් රු. 22,600 ක වාර්ෂික බදු පදනම මත ලබාගෙන තිබුණද, මහජන විරෝධතාව හේතුවෙන් එම ඉඩම අතහැර තිබුණි. එමෙන්ම කසල බැහැර කිරීම සඳහා සුදුසු වෙනත් ස්ථානයක් හඳුනා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය තුල සභාවේ පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. මිලියන 46.39 ක් වු අතර, තත්‍ය වියදම රු. මිලියන 29.47 ක් වීමෙන් ප්‍රතිපාදන වලින් රු. මිලියන 16.92 ක් හෙවත් සියයට 37 ක් උපයෝජනය කර නොතිබුණි. ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු. මිලියන 27.83 ක් වු අතර, තත්‍ය වියදම රු. මිලියන 14.75 ක් විමෙන් ප්‍රතිපාදන වලින් රු. මිලියන 13.08 ක් හෙවත් සියයට 47 ක් උපයෝජනය

කර නොතිබුණි. එමෙන්ම සභාව සතු යන්ත්‍ර කුලියට දීමෙන් රු. 3,300,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද, තත්‍ය ආදායම රු. 503,580 ක් වීමෙන් එම ආදායම සියයට 85 කින් අඩු වී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

05. පද්ධති හා පාලනයන්

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින නොකිරීම. |
| | (ii) | ආදායම්, වියදම් හා වත්කම්, බැරකම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම් ගත කිරීම |
| | (iii) | ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් ලෙජර් ගිණුම් පිළියෙල නොකිරීම |
| | (iv) | අවසන් තොග මැනීම සහ ගිණුම්ගත නොකිරීම |
| (ආ) අයවැය පාලනය | (i) | වැය ප්‍රතිපාදන වල සැලකිය යුතු ඉතිරිවීම් තිබීම |
| | (ii) | ඇස්තමේන්තු ගත ආදායම් අය කර නොගැනීම |
| (ඇ) ආදායම් පරිපාලනය | | හිඟ ආදායම් අය කර නොගැනීම |
| (ඉ) මානව සම්පත් කළමනාකරණය | (i) | පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම |
| | (ii) | පැමිණීම පිටවීම සටහන් නොකිරීම |
| | (iii) | බැහැරයාමේ ලේඛනය නිසිපරිදි පවත්වා නොගැනීම |
| (ඊ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | ක්‍රමාණුකූලව අපද්‍රව්‍ය බැහැර නොකිරීම |
| (උ) කොන්ත්‍රාත් පරිපාලනය | (i) | සැලසුම අනුව වැඩ අවසන් නොකිරීම |
| | (ii) | ඉදිකිරීම් නිසිපරිදි නඩත්තු නොකිරීම |